# අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
# පුරප්පාඩු

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පහත තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.තනතුරු නාමය - කළමනාකරු (මානව සම්පත්)**
**සේවා ගණය - "කණිෂ්ඨ කළමනාකාර"**
**පුරප්පාඩු ගණන - 01**

**01.1.සුදුසුකම්**

**01.1.1.බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු අදාල ක්ෂේත්‍රයේ වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

**01.1.2.අභ්‍යන්තර අයදුම්කරුවන්**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

හෝ

III. කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

හෝ

IV. බලාත්මක කිරීමේ/ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාප්ති නිළධාරි සේවා ගණයේ තනතුරක වසර 08ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**01.2.වැටුප් කාණ්ඩය - JM 1-1**

**01.3. වැටුප් පරිමාණය -**

රු.(42,600 - 10 x 755 – 18 x 1,135 - රු.70,580/-)

(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ)

**01.4. වයස :**

අවුරුදු 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

**02.**තනතුරු නාමය - පරිපාලන නිළධාරි

**සේවා ගණය - "කණිෂ්ඨ කළමනාකාර"**

**පුරප්පාඩු ගණන - 01**

**02.1.**සුදුසුකම්

**02.1.1.**බාහිර අයදුම්කරුවන්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, කළමනාකරණ/ වාණිජවේදී යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු අදාල ක්ෂේත්‍රයේ වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

**02.1.2.**අභ්‍යන්තර අයදුම්කරුවන්

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

හෝ

III. කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

හෝ

IV. බලාත්මක කිරීමේ/ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාප්ති නිළධාරි සේවා ගණයේ තනතුරක වසර 08ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**02.2.**වැටුප් කාණ්ඩය - JM 1-1

**02.3.** වැටුප් පරිමාණය -

රු.(42,600 - 10 x 755 – 18 x 1,135 - රු.70,580/-)

(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ)

**02.4.** වයස :

අවුරුදු 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

**03.**තනතුරු නාමය - කළමනාකරණ සහකාර

**සේවා ගණය - "කළමනාකරණ සහකාර" - තාක්ෂණික නොවන**

**පුරප්පාඩු ගණන - 02**

## 03.1.සුදුසුකම්

### 03.1.1.බාහිර අයදුම්කරුවන්

(අ) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,

i. සිංහල / දෙමළ
ii. ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(පරිගණක වදන් සැකසුම/ යතුරුලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන්)

### 03.1.2 අභ්‍යන්තර අයදුම්කරුවන්

(අ) අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත 'ආ', 'ඇ' සහ 'ඉ' සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,

i. සිංහල / දෙමළ
ii. ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හය (06)කින් සමත්ව තිබීම.

(පරිගණක වදන් සැකසුම/ යතුරුලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන්)

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**සටහන්:- (I)**

යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ පුහුණුවීමේ කාල පරිච්ඡේදයක් ඉහත "ඉ" ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික / අනියම් සේවා කාලපරිච්ඡේද ඉහත "ඉ" ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාලසීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

**03.2** **වැටුප් කාණ්ඩය** **-** MA 1-1

**03.3** **වැටුප් පරිමාණය** -

රු.(27,910 - 10 x 300 – 7 x 350 – 4 x 495 – 20 x 660 - රු.48,540/-)

(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ)

**03.4** **වයස :** අවුරුදු 18ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**වෙනත් :**

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.**

**අයදුම්පත් ඉදිරිපත් කිරීමේ මාධ්‍යය**

සෑම අයදුම්කරුවෙකුම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් තම අයදුම්පත් යොමු කල යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය**

බඳවා ගැනීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ලිඛිත තරඟ විභාගයක හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

**පත්වීමේ ස්වාභාවය**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

**<u>අයදුම්පත් ගාස්තුව</u>**

බාහිර අයදුම්කරුවන් පමණක් අයදුම්පත් ගාස්තුව වශයෙන් රු.500ක මුදලක් ඕනෑම තැපැල් කාර්යාලයක් වෙතින් "සභාපති, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය" නමට ලියන ලද **<u>සාමාන්‍ය මුදල් ඇණවුමක්</u>** අයදුම්පතට අමුණා එවිය යුතුය. එහි ගෙවීම් කාර්යාලය ලෙස රාජගිරිය තැපැල් කාර්යාලය සඳහන් කළ යුතුය. අයදුම්පත් ගාස්තුව නැවත ගෙවනු නොලැබේ.

ඔබගේ තොරතුරු "A4" ප්‍රමාණයේ පිටුවෙහි දෙපසම ප්‍රයෝජනයට ගනිමින් මණ්ඩලයේ වෙබ් පිටුවේ : (www.nddcb.gov.lk) ඇති ආදර්ශ අයදුම්පත සම්පූර්ණ කර (කවරයේ වම් පස ඉහළ කෙලවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සටහන් කර) අදාල සහතිකවල පිටපත් සමඟ 2020.09.14 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් සභාපති, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 383, කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයට ලැබීමට සලස්වන්න. රජයේ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු සේවකයින් තම අයදුම්පත් ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් යොමු කළ යුතුය.

**අසම්පූර්ණ අයදුම්පත්/ මුදල් ඇණවුම අමුණා නොමැති අයදුම්පත්/ ආදර්ශ අයදුම්පත නොමැති අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. බඳවාගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අවසන් තීරණය වේ.**

**සභාපති**
**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය**
**383, කෝට්ටේ පාර,**
**රාජගිරිය.**

ප්‍රකාශිත දිනය : 2020.08.30